(නවවැනි පාර්ලිමේන්තුව - පස්වැනි සභාවාරය)

අංක 29.]

පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

2024 ජුනි 07 සිකුරාදා පූ.භා. 9.30 ට

පැමිණි මන්ත්‍රීන් :

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** කථානායකතුමා

ගරු **අජිත් රාජපක්ෂ මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ නිමල් සිරිපාල ද සිල්වා මහතා,** වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **ඩග්ලස් දේවානන්දා මහතා,** ධීවර අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,** කර්මාන්ත අමාත්‍යතුමා සහ සෞඛ්‍ය අමාත්‍යතුමා

ගරු **නලින් ප්‍රනාන්දු මහතා,** වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා

ගරු **හරීන් ප්‍රනාන්දු මහතා,** සංචාරක හා ඉඩම් අමාත්‍යතුමා සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා

ගරු **නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා,** අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා

ගරු **නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය,** වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමිය සහ වාරිමාර්ග අමාත්‍යතුමිය

ගරු **කංචන විජේසේකර මහතා,** විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා

ගරු **ජනාධිපති නීතිඥ එම්. යූ. එම්. අලි සබ්රි මහතා,** විදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා සහ මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සීතා අරඹේපොල මහත්මිය,** සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අ. අරවින්ද් කුමාර් මහතා,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිරිපාල ගමලත් මහතා,** මහාමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා,** ග්‍රාමීය මාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. වී. චානක මහතා,** විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුරාධ ජයරත්න මහතා,** අධිකරණ හා බන්ධනාගාර කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා,** ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිමල් මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුප පස්කුවල් මහතා,** සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශාන්ත බණ්ඩාර මහතා,** ජනමාධ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තාරක බාලසූරිය මහතා,** විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත බේරුගොඩ මහතා,** පිරිවෙන් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කේ. කාදර් මස්තාන් මහතා,** ග්‍රාමීය ආර්ථික රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ප්‍රසන්න රණවීර මහතා,** කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලොහාන් රත්වත්තේ මහතා,** වැවිලි කර්මාන්ත හා මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සුරේන් රාඝවන් මහතා,** උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා,** වාරිමාර්ග හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජානක වක්කුඹුර මහතා,** පළාත් සභා, පළාත් පාලන සහ පරිසර රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තේනුක විදානගමගේ මහතා,** නාගරික සංවර්ධන හා නිවාස රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෙහාන් සේමසිංහ මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කනක හේරත් මහතා,** තාක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. බී. හේරත් මහතා,** පශු සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කපිල අතුකෝරල මහතා**

ගරු **සම්පත් අතුකෝරල මහතා**

ගරු **වජිර අබේවර්ධන මහතා**

ගරු **(ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු **ඩලස් අලහප්පෙරුම මහතා**

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා**

ගරු තිසකුට්ටි ආරච්චි මහතා

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා

ගරු (ආචාර්ය) මේජර් ප්‍රදීප් උඳුගොඩ මහතා

ගරු සංජීව එදිරිමාන්න මහතා

ගරු ගෝවින්දන් කරුණාකරම් මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු නීතිඥ සාගර කාරියවසම් මහතා

ගරු ෆයිසාල් කාසිම් මහතා

ගරු ජයන්ත කැටගොඩ මහතා

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු ලලිත් වර්ණ කුමාර මහතා

ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා

ගරු වීරසේන ගමගේ මහතා

ගරු උදය ගම්මන්පිල මහතා

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු උදයකාන්ත ගුණතිලක මහතා

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය

ගරු යදාමිණී ගුණවර්ධන මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු මිලාන් ජයතිලක මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු පියංකර ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා

ගරු එම්. එස්. තවුෆික් මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු මංජුලා දිසානායක මහත්මිය

ගරු මයන්ත දිසානායක මහතා

ගරු විමලවීර දිසානායක මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා

ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා

ගරු වාල්ස් නිර්මලනාදන් මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු සු. නෝගරාදලිංගම් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු ජගත් ප්‍රියංකර මහතා

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු සෙය්යිඩ් අලි සාහීර් මවුලානා මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු නීතිඥ එස්. එම්. එම්. මුෂාරෆ් මහතා

ගරු මොහමඩ් මුසම්මිල් මහතා

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු අලි සබ්රි රහීම් මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු වමල් රාජපක්ෂ මහතා

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු නිමල් ලාන්සා මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු ගාමිණී වලේබොඩ මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය

ගරු සී. වී. විග්නේෂ්වරන් මහතා

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා

ගරු නීතිඥ මධුර විතානගේ මහතා

ගරු හේෂා විතානගේ මහතා

ගරු ජනාධිපති නීතිඥ ජයන්ත වීරසිංහ මහතා

ගරු ඩී. වීරසිංහ මහතා

ගරු වීරසුමන වීරසිංහ මහතා

ගරු ජගත් සමරවික්‍රම මහතා

ගරු ජයන්ත සමරවීර මහතා

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා

ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා

ගරු එච්. එම්. එම්. හරීස් මහතා

ගරු අබ්දුල් හලීම් මහතා

ගරු කබීර් හෂීම් මහතා

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා

ගරු විජිත හේරත් මහතා

ගරු සමන්ප්‍රිය හේරත් මහතා

ගරු මර්ජාන් ෆලීල් මහතා

ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා

කුෂානි රෝහණදීර මහත්මිය, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

චමින්ද කුලරත්න මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

හංස අබේරත්න මහතා, සහකාර මහ ලේකම්

කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.

1. **කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** කථානායකවරයා විසින් මතු පළවන නිවේදන කරන ලදී:—

I

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියෝගයට ලක් කරන ලද "ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය පිළිබඳ" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට නිවේදනය කිරීමට කැමැත්තෙමි.

"ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය පිළිබඳ" නමැති පනත් කෙටුම්පතේ ව්‍යවස්ථානුකූලභාවය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය මතු සඳහන් පරිදි වේ:—

- මෙම පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 ව්‍යවස්ථාවට පටහැනි බව ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර ඇත. තවද, පනත් කෙටුම්පතේ 2 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 3 වැනි වගන්තිය සහ 4 වැනි වගන්තියේ දැක්වෙන අරමුණු, ව්‍යවස්ථාවේ 9, 10, 12, 14 (1) (ඉ) සහ 27 (1) (උ) ව්‍යවස්ථාවලට අනනුකූල බව ද ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කර ඇත. පනත් කෙටුම්පතේ 4, 7, 17, 18, 25, 26 සහ 27 වගන්ති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9, 10, 12 (1), 14(1)(ඉ), 14(1)(ඊ) සහ 27(1)(උ) ව්‍යවස්ථාවලට අනනුකූල බව ද ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර ඇත. පනත් කෙටුම්පතේ 7 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 5 සහ 6 වගන්ති යටතේ පිහිටුවා ඇති සභාවට බලය පැවරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9, 10, 12(1), 14(1)(ඉ), 14(1)(ඊ) සහ 27(1)(උ) ව්‍යවස්ථාවලට අනනුකූල බව ද ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර ඇත. ස්ත්‍රී පුරුෂ තැනැත්තන් පිළිබඳ සභාවේ අවශ්‍යතාවය දැක්වෙන පනත් කෙටුම්පතේ 17 සහ 18 වගන්ති සහ සභාවේ පැවැත්ම, කළමනාකරණය සහ බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්යය ඉටු කිරීම සඳහා වන ආනුෂංගික විධිවිධාන සඳහන් පනත් කෙටුම්පතේ 8 සිට 16 දක්වා සහ 19 සිට 24 දක්වා වගන්තිවල විධිවිධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9, 10, 12(1), 14(1)(ඉ), 14(1)(ඊ) සහ 27(1)(උ) ව්‍යවස්ථාවලට අනනුකූල බව ද ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කර ඇත.

- පනත් කෙටුම්පතේ අරමුණු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3, 4(ඇ), 9 සහ 10 වගන්තිවලට අනනුකූල අතර ඒවා පනත් කෙටුම්පතේ අනෙකුත් විධිවිධානවලින් වෙන් කළ නොහැක. එබැවින් සමස්තයක් වශයෙන් මෙම පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3, 4(ඇ), 9 සහ 10 වැනි වගන්තිවලට අනනුකූල බව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කර ඇත.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 80 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 83 සහ/හෝ 84 ව්‍යවස්ථාවේ දක්වා ඇති පරිදි පනත් කෙටුම්පතට පක්ෂව ප්‍රකාශ කරන ලද ඡන්ද සංඛ්‍යාව (නොපැමිණි මන්ත්‍රීවරයන් ද ඇතුළුව) මුළු පාර්ලිමේන්තු මන්ත්‍රී සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු ප්‍රමාණයක් වී ඇත්නම් මිස සහ ජනමත විචාරණයකදී ජනතාව විසින් අනුමත කරනු ලැබ ඇත්නම් මිස සමස්තයක් ලෙස මෙම පනත් කෙටුම්පත නීතියක් බවට පත් කළ නොහැකි බව ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර ඇත.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අද දින කාර්ය සටහන් දැක්වෙන නිල වාර්තාවේ මුද්‍රණය කළ යුතු යැයි මම නියෝග කරමි.''

II

" 'ශ්‍රී ලංකා ගොඩනැගිලි සේවා ඉංජිනේරු සහ තාක්ෂණ ආයතනය (සංස්ථාගත කිරීමේ)' පනත් කෙටුම්පත සලකා බැලීම පිණිස පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 113(2) ප්‍රකාරව, ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට මතු පළ වන මන්ත්‍රීවරයන් අතිරේක සාමාජිකයන් වශයෙන් මා විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි:-

ගරු උදය ගම්මන්පිල මහතා

ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා

ගරු මිලාන් ජයතිලක මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු කුමාරසිරි රත්නායක මහතා

ගරු ගාමිණී වලේබොඩ මහතා

ගරු වීරසුමන වීරසිංහ මහතා''

III

“ ‘දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන)’ පනත් කෙටුම්පත සලකා බැලීම පිණිස පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 113(2) ප්‍රකාරව, ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට ගරු ජගත් සමරවික්‍රම මහතා අතිරේක සාමාජිකයෙකු වශයෙන් ම’විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.”

IV

“පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නිතිඥ ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා විසින් 2024 මාර්තු 21 දින වරප්‍රසාද ප්‍රශ්න යටතේ පාර්ලිමේන්තුවේදී මතු කරන ලද කරුණු ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කරනු ලැබේ.”

V

“පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ලලිත් වර්ණ කුමාර මහතා විසින් 2024 අප්‍රේල් 01 දින වරප්‍රසාද ප්‍රශ්න යටතේ පාර්ලිමේන්තුවේදී මතු කරන ලද කරුණු ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කරනු ලැබේ.”

2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම: (1) අධ්‍යාපන අමාත්‍යවරයා විසින් 2024 අංක 01 දරන පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කර, එම පරිපූරක ඇස්තමේන්තුව රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) අධ්‍යාපන අමාත්‍යවරයා විසින් —

(i) 2023 වර්ෂය සඳහා මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව;

(ii) 2023 වර්ෂය සඳහා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(iii) 2023 වර්ෂය සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(iv) 2023 වර්ෂය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(v) 2023 වර්ෂය සඳහා සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව; සහ

(vi) 2023 වර්ෂය සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව

ඉදිරිපත් කර, එම වාර්තා ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) අධ්‍යාපන අමාත්‍යවරයා විසින් —

(i) 2023 වර්ෂය සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2023 වර්ෂය සඳහා මොනරාගල, හම්බන්තොට සහ වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල වාර්ෂික කාර්ය සාධන වාර්තා

ඉදිරිපත් කර, එම වාර්තා විවෘත සහ වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) අධ්‍යාපන අමාත්‍යවරයා විසින් —

(i) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සම්බන්ධ කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව;

(ii) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සම්බන්ධ කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව; සහ

(iii) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ මැතිවරණ කොමිෂන් සභාව සම්බන්ධ කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව

ඉදිරිපත් කර, එම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) අධ්‍යාපන අමාත්‍යවරයා විසින් 2023 අංක 34 දරන විසර්ජන පනතේ 6(1) වගන්තිය යටතේ 2024.04.05 සිට 2024.04.30 දක්වා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ අංක 240 යටතේ සංවර්ධන වැඩසටහන සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන මඟින් සිදු කරන ලද පරිපූරක වෙන්කිරීම් පිළිබඳ සටහන ඉදිරිපත් කරන ලදී.

එම ලිපිලේඛනය, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(6) අධ්‍යාපන අමාත්‍යවරයා විසින් 2023 වර්ෂය සඳහා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව පරිසරය, ස්වාභාවික සම්පත් හා තිරසර සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(7) ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් 2023 වර්ෂය සඳහා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව මාධ්‍ය, තාරුණ්‍ය, උරුමය හා නූතන පුරවැසියා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(8) අධ්‍යාපන අමාත්‍යවරයා විසින් ක්‍රම හා විධි පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 124(6) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව ක්‍රම හා විධි පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(9) අධ්‍යාපන අමාත්‍යවරයා විසින් 2023 වර්ෂය සඳහා අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව යුක්තිගරුක සහ නීතිගරුක සමාජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(10) සංචාරක හා ඉඩම් අමාත්‍යවරයා සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යවරයා විසින් 2022 වර්ෂය සඳහා යොවුන් සේනාංකයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව මාධ්‍ය, තාරුණ්‍ය, උරුමය හා නූතන පුරවැසියා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(11) අධ්‍යාපන අමාත්‍යවරයා විසින් 2023 වර්ෂය සඳහා ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව ආගමික කටයුතු හා සහජීවනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

3. කාරක සභා වාර්තා පිළිගැන්වීම: (1) රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති, ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද —

(i) 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමන) පනත යටතේ නියෝගය;

(ii) 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමන) පනත යටතේ නියමය; සහ

(iii) 2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනත යටතේ නිවේදනය

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(2) ආහාර සුරක්ෂිතතාවය සහ කෘෂිකර්මය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති, ගරු ඩී. වීරසිංහ මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද සත්ව සුබසාධන පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

4. මහජන පෙත්සම් පිළිගැන්වීම:

(1) වීනවරාය, ධාන්‍යගම, ප්‍රාදේශීය සෞඛ්‍ය මධ්‍යස්ථානය අසල, අංක 43/1 දරන ස්ථානයෙහි පදිංචි එච්.ඒ.පී. ධර්මසේන මහතාගෙන් ලැබුණු 2023.11.03 දිනැති පෙත්සම ගරු ඩලස් අලහප්පෙරුම මහතා විසින් පිළිගන්වන ලදී.

(2) දික්වැල්ල, පොල්ගහමුල්ල, 'ජය නිවස' යන ලිපිනයෙහි පදිංචි පී.ඒ. කරුණාසේන මහතාගෙන් ලැබුණු 2024.03.30 දිනැති පෙත්සම ගරු වීරසුමන වීරසිංහ මහතා විසින් පිළිගන්වන ලදී.

30(10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරනු ලැබේ.

5. පාර්ලිමේන්තුවේ වැඩකටයුතු (අංක 1): පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— අද දින ආණ්ඩුවේ වැඩකටයුතු මුඛ්‍යස්ථානය ගත යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

6. පාර්ලිමේන්තුවේ වැඩකටයුතු (අංක 2): පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතුවල අංක 54 සහ අංක 55 දරන විෂයයන් පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27 හි විධිවිධානවලින් නිදහස් විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

7. කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ නියෝග: අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා ,— 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 52(5) වගන්තිය සමඟ කියවිය යුතු 71 වගන්තිය යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව විමසා, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 ඔක්තෝබර් 25 දිනැති අංක 2355/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.12.02 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

නියෝගය සභාවේ අවසරය ඇතිව ඉල්ලා අස්කර ගන්නා ලදී.

8. අත්‍යාවශ්‍ය මහජන සේවා පනත යටතේ යෝජනා සම්මතය: අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— 1979 අංක 61 දරන අත්‍යාවශ්‍ය මහජන සේවා පනතේ 2 වගන්තිය ප්‍රකාරව ජනාධිපතිවරයා වෙත පැවරී ඇති බලතල අනුව, 2024 මැයි 21 දිනැති අංක 2385/11 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ හා එහි උපලේඛනයෙහි පළ කරනු ලැබ, 2024.05.22 දින ඉදිරිපත් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය.

යෝජනා සම්මතය සභාවේ අවසරය ඇතිව ඉල්ලා අස්කර ගන්නා ලදී.

9. රාජ්‍ය ණය කළමනාකරණ පනත් කෙටුම්පත: දෙවැනිවර කියවීමේ නියෝගය කියවන ලදී.

"පනත් කෙටුම්පත දැන් දෙවැනිවර කියවිය යුතු ය"යි මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

(පූ.භා. 11.23 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

"ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 1.33 ට ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා මූලාසනාරූඪ විය.)

"ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය මූලාසනාරූඪ විය යුතු ය"යි ජනමාධ්‍ය රාජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3. 44 ට ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය මූලාසනාරූඪ වූවා ය.)

(අ.භා. 4. 46 ට කථානායකවරයා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනි වර කියවන ලදී.

"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය" යි මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේ දී)

කථානායකවරයා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තිය සභා සම්මත විය.

2 වැනි වගන්තිය

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කළ සංශෝධනයක්: 1 වැනි පිටුවේ 16 වැනි සහ 17 වැනි පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"ලේකම් කාර්යාල සහ විශේෂ වියදම් ඒකක;";

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

3 වැනි වගන්තිය

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කළ සංශෝධනයක්: 2 වැනි පිටුවේ 2 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''ඇතිව, රාජ්‍ය ණය කළමනාකරණය කිරීම සඳහා මධ්‍යකාලීන සිට''; සහ

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කළ තවත් සංශෝධනයක්: 2 වැනි පිටුවේ 7 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''(ආ) මධ්‍යකාලීන සිට දිගුකාලීන දක්වා වන කාලය තුළ'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

4 වැනි සහ 5 වැනි වගන්ති සභා සම්මත විය.

6 වැනි වගන්තිය

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කළ සංශෝධනයක්: 3 වැනි පිටුවේ 9 වැනි පේළියේ සිට 14 වැනි පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''(ආ) ආණ්ඩුවේ දේශීය සහ විදේශීය ණයට ගැනීම්, අනෙකුත් ණය විධිවිධාන සැලසීම් සහ ණය කළමනාකරණ කටයුතුවලට අදාළ මූල්‍යමය නියම සහ කොන්දේසි පිළිබඳ සම්මුති සාකච්ඡා පැවැත්වීම සහ ක්‍රියාත්මක කිරීම:

එසේ වුව ද, ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික නියෝජ්‍යායතනවලින් කරනු ලබන ආණ්ඩුවේ විදේශීය ණය''; සහ

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කළ තවත් සංශෝධනයක්: 4 වැනි පිටුවේ 1 වැනි සහ 2 වැනි පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''(ඌ) මේ පනතට අනුකූලව, කාලීනව ආණ්ඩුවේ ණය සේවාකරණය සිදු කිරීම;'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

7 වැනි වගන්තිය සභා සම්මත විය.

8 වැනි වගන්තිය

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කළ සංශෝධනයක්: 4 වැනි පිටුවේ 21 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''(ඇ) භාණ්ඩාගාරයේ මූල්‍ය ප්‍රතිපත්ති විෂයය'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කළ තවත් සංශෝධනයක්: 4 වැනි පිටුවේ 24 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන්;

(ඉ) භාණ්ඩාගාරයේ ජාතික අයවැය විෂයය භාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන්;

(ඊ) භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යවසාය විෂයය භාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන්;'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

9 වැනි වගන්තිය

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කළ සංශෝධනයක්: 5 වැනි පිටුවේ 18 වැනි පේළියේ සිට 20 වැනි පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''සමාලෝචනය කොට, රාජ්‍ය ණය හා සම්බන්ධ වූ අවදානම පිළිබඳව සහ වෙළඳපොළේ ඇති අවස්ථා සහ නිල සංවර්ධන සහයෝගීතාව පිළිබඳව නිර්දේශ ලබා දීම;''; සහ

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කළ තවත් සංශෝධනයක්: 5 වැනි පිටුවේ 22 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(ඇ) 3 වන වගන්තිය යටතේ වූ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ කාර්ය සඳහා අමාත්‍යවරයා"; සහ

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

10 වැනි වගන්තිය සභා සම්මත විය.

11 වැනි වගන්තිය

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කළ සංශෝධනයක්: 6 වැනි පිටුවේ 23 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"කරන ලද්දේ යම් වර්ෂයක් සඳහා ද එකී වර්ෂයේ";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කළ තවත් සංශෝධනයක්: 6 වැනි පිටුවේ 29 වැනි පේළියේ සිට 32 වැනි පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"කාර්යය සඳහා, (1) වන උපවගන්තිය යටතේ වාර්ෂිකව අඛණ්ඩ අවුරුදු පහක කාලසීමාවක් සඳහා සකස් කරන ලද සහ යාවත්කාලීන කරන ලද උපායමාර්ගය මගින් ඉදිරි මුදල් වර්ෂය සහ පසුව එළඹෙන මුදල් වර්ෂ හතර සමන්විත වන අතර, ඒ සඳහා පහත කරුණු සැලකිල්ලට ගනු ලැබිය යුතු ය -"; සහ

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කළ තවත් සංශෝධනයක්: 7 වැනි පිටුවේ 4 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(ඉ) උපායමාර්ගය සකස් කිරීමට අදාළ විය හැකි වෙනත්";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

12 වැනි වගන්තිය

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කළ සංශෝධනයක්: 7 වැනි පිටුවේ 18 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(2) ශ්‍රී ලංකාවේ ආණ්ඩුවේ ණය, ඒකාබද්ධ අරමුදලට";

“සංශෝධනය පිළිගත යුතු ය” යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

“වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය” යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

13 වැනි වගන්තිය

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කළ සංශෝධනයක්: 7 වැනි පිටුවේ 22 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

“අයවැයේ යම් හිඟයක් මූල්‍යනය කිරීම;”;

“සංශෝධනය පිළිගත යුතු ය” යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කළ තවත් සංශෝධනයක්: 8 වැනි පිටුවේ 20 වැනි සහ 21 වැනි පේළි ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

“(ඌ) ශ්‍රී ලංකාවේ විදේශ ව්‍යවහාර මුදල් සංචිත ප්‍රතිපූරණය කිරීම මගින් ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂයට සහාය වීම”;

“සංශෝධනය පිළිගත යුතු ය” යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

“වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය” යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

14 වැනි වගන්තිය

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කළ සංශෝධනයක්: 8 වැනි පිටුවේ 34 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

“(2) (1) වන උපවගන්තිය යටතේ”;

“සංශෝධනය පිළිගත යුතු ය” යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කළ තවත් සංශෝධනයක්: 9 වැනි පිටුවේ 4 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

“විසින් දරන ලද යම් පිරිවැයක්, මහ”; සහ

“සංශෝධනය පිළිගත යුතු ය” යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කළ තවත් සංශෝධනයක්: 9 වැනි පිටුවේ 8 වැනි සහ 9 වැනි පේළි ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

“සටහන් විය යුතු අතර 25 වන වගන්තිය යටතේ වෙනම අයිතමයක් ලෙස වාර්ෂික වාර්තාවේ සටහන් විය යුතු ය.”;

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

15 වැනි වගන්තියේ සිට 19 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

20 වැනි වගන්තිය

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කළ සංශෝධනයක්: 13 වැනි පිටුවේ 15 වැනි සහ 16 වැනි පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> ''ගැනුම්කරු යම් මූල්‍ය අපහසුතාවයකින් යුක්ත නොවීම; සහ'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

21 වැනි වගන්තිය

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කළ සංශෝධනයක්: 14 වැනි පිටුවේ 17 වැනි පේළියේ සිට 19 වැනි පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> ''21. (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, අමාත්‍යවරයාට, ආණ්ඩුව වෙනුවෙන් රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති සඳහා'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

22 වැනි වගන්තිය

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කළ සංශෝධනයක්: 14 වැනි පිටුවේ 29 වැනි පේළියේ සිට 31 වැනි පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> ''22. (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, අමාත්‍යවරයාට, ආණ්ඩුව වෙනුවෙන් මූල්‍ය කල්බදු ගිවිසුම්වලට'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

23 වැනි වගන්තිය සභා සම්මත විය.

24 වැනි වගන්තිය

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කළ සංශෝධනයක්: 16 වැනි පිටුවේ 12 වැනි සහ 13 වැනි පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(ඊ) 21 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ආණ්ඩුව විසින් එළඹෙන ලද සැපයුම්කරුවන්ගේ ණය ගිවිසුම් පිළිබඳ තොරතුරු;"; සහ

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කළ තවත් සංශෝධනයක්: 16 වැනි පිටුවේ 14 වැනි සහ 15 වැනි පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(උ) 22 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ආණ්ඩුව විසින් එළඹෙන ලද මූල්‍ය කල්බදු ගිවිසුම් පිළිබඳ තොරතුරු; සහ

(ඌ) 14 වන වගන්තිය යටතේ මුදල් ප්‍රතිපත්තියේ අරමුණු ක්‍රියාත්මක කිරීමට සහාය ලබා දීමේ කාර්ය සඳහා ණය සුරැකුම්පත් නිකුතුවල හිඟව ඇති අගයයන්,";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

25 වැනි වගන්තිය සභා සම්මත විය.

26 වැනි වගන්තිය

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කළ සංශෝධනයක්: 18 වැනි පිටුවේ 6 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"සුරැකුම්පත් ප්‍රසිද්ධ නිකුතුවක් සහ නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින්";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

27 වැනි වගන්තියේ සිට 30 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

31 වැනි වගන්තිය

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කළ සංශෝධනයක්: 21 වැනි පිටුවේ 8 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම සඳහා, අමාත්‍යවරයා විසින්, මහ බැංකුවේ නිර්දේශය සහිතව,";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කළ තවත් සංශෝධනයක්: 21 වැනි පිටුවේ 9 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "ප්‍රාථමික අලෙවිකරුවන් පත් කළ හැකි ය.

(3) ප්‍රාථමික අලෙවිකරුවන් පත් කිරීම කාර්යාලය විසින් උචිත යයි සලකනු ලබන යම් නියම සහ කොන්දේසිවලට යටත් විය යුතු අතර, එයට පහත සඳහන් දෑ ඇතුළත් විය යුතු ය:—

(අ) අස්ථිත්වයේ මූල්‍ය තත්ත්වය;

(ආ) මේ පනත මගින් හෝ ඒ යටතේ අස්ථිත්වය මත පනවනු ලබන කාර්ය ඉටු කිරීමට එය සතු පළපුරුද්ද සහ හැකියාව;

(ඇ) අස්ථිත්වයේ නෛතික සහ නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම; සහ

(ඈ) මහජන යහපත.

(4) (417 වන අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත සහ (420 වන අධිකාරය වූ) ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත යටතේ පත් කරන ලද ප්‍රාථමික අලෙවිකරුවන් මේ පනත යටතේ අඛණ්ඩව ම ප්‍රාථමික අලෙවිකරුවන් විය යුතු අතර, මේ පනත යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝගවලට යටත් විය යුතු ය.

(5) (අ) (2) වන උපවගන්තිය යටතේ සහ (417 වන අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත සහ (420 වන අධිකාරය වූ) ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත යටතේ පත් කරන ලද ප්‍රාථමික අලෙවිකරුවන් නියාමනය කිරීමේ, සුපරීක්ෂණය කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ බලය මහ බැංකුව සතු විය යුතු ය;

(ආ) (417 වන අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත සහ (420 වන අධිකාරය වූ) ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත යටතේ ප්‍රාථමික අලෙවිකරුවකු විසින් කරන ලද හෝ කරනු ලැබිය හැකි වැරදි නඩු විභාග කොට නඩු කටයුතු පවරනු ලැබ අදාළ ආඥාපනත් යටතේ නිශ්චිතව දක්වන ලද එම දඬුවම්වලට ම යටත් විය යුතු අතර, එකී වැරදි සම්බන්ධයෙන් පවත්වාගෙන යන හෝ අනාගතයේ දී පවත්වාගෙන යනු ලබන යම් විමර්ශනයක්, විභාගයක් හෝ පවරන ලද හෝ පැවරීමට ඇති යම් සිවිල් නඩුවක්, නඩුකරයක් හෝ නඩුවක් අදාළ ආඥාපනත්වල විධිවිධාන යටතේ, අවස්ථාවෝචිත පරිදි, පවත්වාගෙන යාම, විභාග කිරීම හෝ තීරණය කිරීම කරනු ලැබිය යුතු ය.

(6) යම් ප්‍රාථමික අලෙවිකරුවකු විසින්, ප්‍රාථමික අලෙවිකරුවකු වශයෙන් සිය කාර්ය ඉටු කිරීම නොතකා, ප්‍රාථමික අලෙවිකරුවකු වශයෙන් එම පත්වීම අවලංගු කිරීම හෝ අත්හිටුවීම සඳහා පදනමක් විය හැකි නෛතික සහ නියාමන අවශ්‍යතාවන් සමඟ ප්‍රාථමික අලෙවිකරුවන්ගේ අනනුකූලතාවය පිළිබඳ මහ බැංකුව විසින් අමාත්‍යවරයා වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

(7) අමාත්‍යවරයා විසින්, ප්‍රාථමික අලෙවිකරුවන් පත් කිරීමේ කාර්ය සඳහා සහ මේ පනත යටතේ පත් කරනු ලබන ප්‍රාථමික අලෙවිකරුවන් විසින් පිළිපැදිය යුතු කොන්දේසි, ඔවුන්ගේ වරප්‍රසාද සහ ඔවුන් විසින් ඉටු කළ යුතු කාර්ය සඳහා නියෝග සාදනු ලැබිය හැකි ය.''; සහ

(8) (ඇ) (417 වන අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත සහ (420 වන අධිකාරය වූ) ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත යටතේ පත් කරන ලද ප්‍රාථමික අලෙවිකරුවන් සම්බන්ධයෙන් අමාත්‍යවරයා හෝ මහ බැංකුව හෝ මහ බැංකුවේ යම් නිලධරයකු විසින් සාදන ලද හෝ නිකුත් කරන ලද සහ පත් කරන ලද දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පවත්නා හෝ බලාත්මකව පවත්නා සියලු රීති, නියෝග, විධාන, තීරණ, නියම, අනුමත කිරීම් හෝ ප්‍රතික්ෂේප කිරීම්, දැන්වීම්, චක්‍රලේඛ, මෙහෙයුම් උපදෙස්, ආචාර ධර්ම සංග්‍රහය හෝ වෙනත් යම් ලිඛිත සන්නිවේදන අඛණ්ඩව ක්‍රියාත්මක විය යුතු අතර, මේ පනත යටතේ පත් කරන ලද ප්‍රාථමික අලෙවිකරුවන්ට අදාළ විය යුතු ය.'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කළ තවත් සංශෝධනයක්: 21 වැනි පිටුවේ 10 වැනි පේළියේ සිට 13 වැනි පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කළ තවත් සංශෝධනයක්: 21 වැනි පිටුවේ 23 වැනි පේළියේ සිට 25 වැනි පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''(10) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයන් මගින්, අදාළ ලිඛිත නීතියකට අනුකූලව, විද්‍යුත් ක්‍රමයට නිර්ලේඛන සුරැකුම්පත් නිකුත් කිරීමට, හිමිකාරීත්වය ගබඩා කිරීමට, එම සුරැකුම්පත්වල හිමිකම සහ පොලිය වාර්තාගත කිරීමට සහ එම සුරැකුම්පත්වල ගනුදෙනු පියවීමට සුරැකුම්පත් තැන්පතු පද්ධතියක් නම් කරනු ලැබිය යුතු ය.:

එසේ වුව ද, එවැනි නම් කිරීමක් සිදු කරනු ලබන තෙක්, ආණ්ඩුව විසින් නිකුත් කරන ලද සුරැකුම්පත් සඳහා අදාළ නීති යටතේ මහ බැංකුව විසින් පිහිටුවා පවත්වාගෙන යනු ලබන රෙජිස්ටරය අඛණ්ඩව ක්‍රියාත්මක විය යුතුය.'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

32 වැනි වගන්තිය

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කළ සංශෝධනයක්: 21 වැනි පිටුවේ 27 වැනි පේළියේ සිට 32 වැනි පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "අමාත්‍යවරයා විසින් 35 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව නියෝග සෑදීම සඳහා ඔහු සතු බලය හැර, ඒ නියමයේ නිශ්චිතව සඳහන් කර ඇති යම් කොන්දේසි, වෙන් කිරීම් සහ සීමා කිරීම්වලට යටත්ව,";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කළ තවත් සංශෝධනයක්: 22 වැනි පිටුවේ 1 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "මේ පනතින් අමාත්‍යවරයා වෙත පිරිනමන ලද යම් බලයක්,";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

33 වැනි වගන්තිය

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කළ සංශෝධනයක්: 22 වැනි පිටුවේ 5 වැනි සහ 6 වැනි පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "33. ආණ්ඩුව, අමාත්‍යවරයා හෝ අමාත්‍යවරයා විසින් තත්කාර්ය සඳහා,";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

34 වැනි වගන්තිය සහ 35 වැනි වගන්තිය සභා සම්මත විය.

36 වැනි වගන්තිය

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කළ සංශෝධනයක්: 23 වැනි පිටුවේ 5 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "36. (1) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද,"; සහ

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කළ තවත් සංශෝධනයක්: 23 වැනි පිටුවේ 9 වැනි පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

> "(2) (1) වන උපවගන්තියේ බලතල ව්‍යාප්තිය සීමා කිරීමෙන් තොරව, ණය ගැනීමට, ආණ්ඩුවේ ණය සුරැකුම්පත් ගැනීම නිකුත් කිරීමට, ණය ඇපකර, සැපයුම්කරුවන්ගේ ණය ගිවිසුම් සහ මූල්‍ය කල්බදු ගිවිසුම් සහ ආණ්ඩුවේ ණය සුරැකුම්පත් ප්‍රාථමික සහ ද්විතියික වෙළඳපොළ ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම සඳහා ප්‍රාථමික අලෙවි නියෝජිතයන් පත් කිරීමට අමාත්‍යවරයා සතු අධිකාරී බලය සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

37 වැනි වගන්තිය සභා සම්මත විය.

38 වැනි වගන්තිය

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කළ සංශෝධනයක්: 23 වැනි පිටුවේ 17 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "38. නියමිත දිනයට පෙර ඇතුළු වූ හෝ නිකුත් කරන ලද යම් ආණ්ඩුවේ ණය සුරැකුම්පත්"; සහ

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කළ තවත් සංශෝධනයක්: 38 වැනි වගන්තියේ පැති සටහන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> (2) පැති සටහන ඉවත් කර, පහත දැක්වෙන කොටස අදේශ කරන්න :—
>
> "පවත්නා ණය
>
> ගැනීමේ සාධන
>
> පත්‍ර අදාළ වීම
>
> සඳහා වන
>
> වැඩපිළිවෙළ."

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

39 වැනි වගන්තිය

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කළ සංශෝධනයක්: 23 වැනි පිටුවේ 26 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> ''සකසන ලද ලේඛනය අදහස් වන අතර, එය-'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කළ තවත් සංශෝධනයක්: 23 වැනි පිටුවේ 27 වැනි පේළියේ සිට 29 වැනි පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> ''(අ) නියම කරනු ලැබිය හැකි ආකෘතිවලින් වූ ආදායම් සහ වියදම් තක්සේරුවලින්; සහ'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කළ තවත් සංශෝධනයක්: 23 වැනි පිටුවේ 30 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> ''වෙනත් කරුණු අතර'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කළ තවත් සංශෝධනයක්: 26 වැනි පිටුවේ 22 වැනි පේළියේ සිට 24 වැනි පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> ''රජයට අයත් ව්‍යවසායයන්'' යන්නෙන්, ශ්‍රී ලංකා මහ බැංකුව සහ ස්වකීය ව්‍යාපාරය පාර්ශ්වික වශයෙන් හෝ පූර්ණ වශයෙන් ණයට දීම හෝ ණයට ගැනීම වන්නා වූ ද රක්ෂණ''; සහ

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කළ තවත් සංශෝධනයක්: 27 වැනි පිටුවේ 12 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> ''අරමුදලක් අදහස් වන අතර සකසුරුවම්, ඉතිරි කිරීම හෝ සමාජය ගොඩනැගීම ඇතුළු අනුමත අවසන් කිරීමේ අරමුදල් හෝ සේවා නියුක්තයන් විසින් දායක වනු ලබන සුබසාධක අරමුදලක් හෝ අදාළ ලිඛිත නීතිය යටතේ සේවා නියුක්තයන්ගේ සේවය අවසන් කිරීමේ දී පාරිතෝෂික දීමනා ගෙවීමේ කාර්යය සඳහා පවත්වාගෙන යනු ලබන යම් පාරිතෝෂික අරමුදලක් හෝ මෙයට ඇතුළත් නොවේ.''; සහ

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

40 වැනි වගන්තිය සභා සම්මත විය.

දීර්ඝ නාමය

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කළ සංශෝධනයක්: ''ආණ්ඩුව වෙනුවෙන් රාජ්‍ය ණය ගැනීම, නිකුත් කිරීම සහ රාජ්‍ය ණය සේවාකරණය සඳහා බලය ලබා දීම සහ ඇපකර නිකුත් කිරීම, උපණය දීම්, සැපයුම්කරුවන්ගේ ණය ගිවිසුම් සහ කල්බදු මූල්‍යකරණ ගිවිසුම් ඇති කර ගැනීම ඇතුළුව රාජ්‍ය ණය කළමනාකරණය පිණිස;'' යන වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමට:—

''රාජ්‍ය ණය ගැනීම, නිකුත් කිරීම සහ රාජ්‍ය ණය සේවාකරණය, ඇපකර නිකුත් කිරීම, උපණය දීම, සැපයුම්කරුවන්ගේ ණය ගිවිසුම් සහ මූල්‍ය කල්බදු ගිවිසුම් ඇති කර ගැනීම ඇතුළුව රාජ්‍ය ණය කළමනාකරණය කිරීම පිණිස බලය ලබා දීම පිණිස ද''

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''දීර්ඝ නාමය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය

''ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'', යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

''පනත් කෙටුම්පත දැන් සංශෝධිතාකාරයෙන් තුන්වැනිවර කියවිය යුතු ය''යි මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව, සංශෝධිතාකාරයෙන් තුන්වැනිවර කියවා සභා සම්මත කරන ලදී.

10. වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත යටතේ නියමය: අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනතේ 3(3) වගන්තිය යටතේ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 දෙසැම්බර් 31 දිනැති අංක 2364/37 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.04.02 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

11. දේශීය ආදායම් පනත යටතේ යෝජනාව: අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2024.04.24 දින ඉදිරිපත් කරන ලද, ආදායම් මත වූ බදු සම්බන්ධයෙන් ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ බදු නොගෙවා මග හැරීම වැළැක්වීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ සෞදි අරාබි රාජධානියේ ආණ්ඩුව අතර, 2023 ජනවාරි 26 දින ඇතිකර ගත් සම්මුතිය, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 75(1) වගන්තිය යටතේ අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

12. විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 1): අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 නොවැම්බර් 30 දිනැති අංක 2360/52 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.04.25 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

13. විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 2): අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 ජනවාරි 02 දිනැති අංක 2365/04 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.04.25 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

14. විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 3): අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 ජනවාරි 07 දිනැති අංක 2365/84 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.04.25 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

15. විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 4): අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 පෙබරවාරි 19

දිනැති අංක 2372/06 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.04.25 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

16. විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 5): අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 මාර්තු 01 දිනැති අංක 2373/42 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.04.25 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

17. දේශීය ආදායම් පනත යටතේ නියෝගය: අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2023 අංක 4 දරන දේශීය ආදායම් (සංශෝධන) පනතින් සංශෝධිත 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 123(8) වගන්තිය යටතේ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත නිතිපතා ලබාදිය යුතු තොරතුරු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 මාර්තු 21 දිනැති අංක 2376/25 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.05.07 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

18. සුබසාධක ප්‍රතිලාභ පනත යටතේ නියෝග: අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනතේ 7(3), 8, 10, 11 සහ 12 වගන්ති සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(3) ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු එම පනතේ 27 වගන්තිය යටතේ සුබසාධක ප්‍රතිලාභ සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2024 අප්‍රේල් 29 දිනැති අංක 2382/02 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.05.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

19. වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත යටතේ නියෝගය: අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බදු පනතේ 3(3) වගන්තිය යටතේ වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද සම්බන්ධයෙන් වැඩබලන මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 සැප්තැම්බර් 21 දිනැති අංක 2350/45 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.02.22 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

20. සුබසාධක ප්‍රතිලාභ පනත යටතේ අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය: අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනතේ 9 වගන්තිය යටතේ සුබසාධක ප්‍රතිලාභ සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 මැයි 17 දිනැති අංක 2384/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.06.04 දින ඉදිරිපත් කරන ලද අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

21. අත්‍යාවශ්‍ය මහජන සේවා පනත යටතේ යෝජනා සම්මතය: අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1979 අංක 61 දරන අත්‍යාවශ්‍ය මහජන සේවා පනතේ 2 වගන්තිය ප්‍රකාරව ජනාධිපතිවරයා වෙත පැවරී ඇති බලතල අනුව, 2024 ජුනි 04 දිනැති අංක 2387/11 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ හා එහි උපලේඛනයෙහි පළ කරනු ලැබ, 2024.06.06 දින ඉදිරිපත් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

22. කල් තැබීම: "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය"යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

එකල්හි වේලාව අ.භා. 5.30 වූයෙන් කථානායකවරයා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2024 ජුනි 18 අඟහරුවාදා පූ.භා. 9.30 වනතෙක් කල් ගියේ ය.